(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 1(6).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2010 ජූලි මස 30 වැනි සිකුරාදා**

---

## 2010 අගෝස්තු මස 17 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0303/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 සහ 2009 වර්ෂවල දී ඖෂධ මිල දී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණ ද;

(ii) එම මුදලින් එකී වර්ෂයන් සඳහා අමාත්‍යාංශය වෙත ලැබුණු සත්‍ය මුදල කොපමණ ද;

(iii) එක් එක් වර්ෂය සඳහා ඖෂධ මිල දී ගැනීමට පත් කර තිබෙන කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය කාලයේ ඇති වූ ඖෂධ හිඟයට හේතුව ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0304/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වත්මන් මැතිවරණ කොමසාරිස්වරයා විශ්‍රාම යන දිනය කවරේද;

(ii) ඔහුගේ වර්තමාන වැටුප කොපමණ ද;

(iii) විශ්‍රාම යා යුතු වයස පසු කොට ඇති ඔහු තවදුරටත් සේවයෙහි යොදවා ගැනීමෙන් සිදුවී ඇති ඔහුගේ මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් ගන්නා පියවරයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මැතිවරණ කොමිසම ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නේ ද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0302/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) (i) සීගිරිය ලෝක උරුමයේ බඹර ජනපද පලවා හැරීමේ දී රසායනික ද්‍රව්‍යයක් භාවිතා කළේද;

(ii) බඹරුන් පලවා හැරීම හේතුවෙන් වෙනත් කෘමි විශේෂ එම භූමිය ආක්‍රමණය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගන්නා පියවර කවරේද;

(iv) සීගිරිය පුරාවිද්‍යා භූමිය ජපන් සමාගමකට විකුණා හෝ බදු දී හෝ ඒ හා සමාන කටයුත්තක් කර තිබේ ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සීගිරි ගල පාමුල වැසිකිළි පද්ධතියක් ඉදිකරන බව එතුමිය දන්නෙහිද?

(ඇ) සීගිරි ගලට හානි වන අන්දමින් සිදු කරන සියලුම ඉදිකිරීම් නතර කිරීමට එතුමිය පියවර ගන්නෙහිද?

(ඈ)නොඑසේ නම්, ඒ මන්ද?

0044/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආනයනය කරන ලද හා දේශීයව නිෂ්පාදනය කරන ලද සහල්, සීනි, තිරිඟු පිටි, පරිප්පු, කිරිපිටි, ලූනු හා මිරිස් ආදී භාණ්ඩ මුළු ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත භාණ්ඩ මත පනවා ඇති තීරුබදු, වැට් බදු හා නිෂ්පාදන බදු ප්‍රමාණයන් කවරේද;

(iii) ඉහත (ii) ට අනුව තීරුබදු හා බදු මගින් උපයාගත් මුළු ආදායම කොපමණද;

යන්න පසුගිය වසර 5ට අදාලව, වෙන් වෙන් වශයෙන්, එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0038/'10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල අයිතිය, ගිවිසුම්වලට එළැඹීමෙන් තොරව නීත්‍යානුකූල නොවන ආකාරයෙන් විවිධ පුද්ගලයින් වෙත පවරා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් පවරා දී ඇති පදනම, පැවරුම්ලාභීන්ගේ නම් හා ලබා දී ඇති ඉඩම්වල ප්‍රමාණයන් කොපමණද;

(ii) නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව එම ඉඩම් පවරා දුන් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0045/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ දක්වා වූ පසුගිය වර්ෂ10 තුළ උද්ධමන අනුපාතය කවරේද;

(ii) පසුගිය වසර 2 තුළ උද්ධමන අනුපාතය මාසික පදනමින් කවරේද;

(iii) පසුගිය අවුරුදු 10 තුළ පොළී අනුපාතයන්, භාණ්ඩාගාර බිල්පත් විකිණුම් අනුපාතයන් සහ ප්‍රති මිලදී ගැනීම් අනුපාතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0064/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස 5 කට පෙර තාර දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හත්පොරුව, අලිඔලුආර ග්‍රාම නිලධාරි වසමේ, අලිඔලුආර නුගේ අසල සිට හත්පොරුව දක්වා මාර්ගයේ කි.මී. 1 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට තාර කුට්ටි වශයෙන් ගැලවී, ගමන් කිරීමට නොහැකි තත්වයට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0226/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල් වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0227/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුලදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0152/'10

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියෙන් ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් සහ ජල අවශ්‍යතා සපුරා ගන්නා පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් ව්‍යාපෘතිය මගින් දැනට සපයනු ලබන ජලය ප්‍රමාණවත්ද;

(ii) ව්‍යාපෘති ජල ධාරිතාව ප්‍රමාණවත් නොවේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ උග්‍ර පානීය ජල අවශ්‍යතා තිබෙන ප්‍රදේශ අළුතින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවායේ නම් කවරේද;

(iii) එම ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා මේ වන විට සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, එම සැලසුම් (ව්‍යාපෘති) කවරේද;

(v) එක් එක් ව්‍යාපෘතිය සඳහා ජලය ලබාගැනීමට අපේක්ෂිත ජල මූලාශ්‍රය කවරේද;

(vi) එම ව්‍යාපෘතිවලින් කොපමණ පවුල් සංඛ්‍යාවකට පානීය ජල පහසුකම් සැලසීමට අපේක්ෂිතද;

(vii) සැලසුම්කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ඉදිරි වැඩපිළිවෙල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0103/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අම්බලන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රී චන්ද්‍රදාස නයිදුවාවඩු මහතාට ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය ඇතුළු මැර පිරිසක් විසින් මරණීය තර්ජනය කළ බවට ඒ මහතා විසින් අංක EIB 52/37 යටතේ අම්බලන්ගොඩ පොලිසියේ පැමිණිල්ලක් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පැමිණිල්ල අම්බලන්ගොඩ පොලිසිය මගින් විභාග කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඊට ආදළව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2010 ජනවාරි 25 අලුයම කළ පහරදීමක් හේතුවෙන් 2010.02.02 දින මියගිය නාගරික මන්ත්‍රී නයිදුවාවඩු මහතා, තමාට කරන ලද පහරදීම සම්බන්ධයෙන්, ඔහු මියයාමට පෙර, අංක EIB 106/86 යටතේ, ඔහු විසින් අම්බලන්ගොඩ පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කල බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඒ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ පොලිසිය ගත් ක්‍රියාමාර්ගයන් කවරේද;

(ii) එම පැමිණිල්ලට අනුව ඔහුට පහර දුන් පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) මේ වන විට පහරදුන් පුද්ගලයින් අත් අඩංගුවට ගෙන තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(v) මෙම පහරදීම හා ඝාතනය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට එතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0361/'10

ගරු ප්‍රභා ගනේසන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැනට ක්‍රියාත්මක හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගෙන ගාල්ල, බූස්ස කඳවුරේ රඳවාගෙන සිටින සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අයත් වන වයස් කාණ්ඩ කවරේද;

(ii) එලෙස බන්ධනාගාරගත කර ඇති ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව සහ පුරුෂයින්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0362/'10

ගරු ප්‍රභා ගනේසන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැනට ක්‍රියාත්මක හදිසි නීතිය යටතේ රඳවාගෙන සිටින සැකකරුවන් අතරින් අධිකරණයට ඉදිරිපත් කර ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) නඩු විභාගයකට ඉදිරිපත් කිරීමට ඉතිරිව සිටින සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0356/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බණ්ඩාරගම මහජන ක්‍රීඩාංගනය අයත් රාජ්‍ය ආයතනය කවරේද;

(ii) එම ක්‍රීඩාංගනයේ විශාලත්වය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගනය විවිධ ක්‍රීඩා තරඟ ජාතික මට්ටමෙන් පැවැත්වීම සඳහා සංවර්ධනය කළ හැකි තරම් ඉඩ ප්‍රමාණයකින් යුත්, යටිතල පහසුකම් ඇති ස්ථානයක පිහිටා ඇති බවත්;

(ii) මීටර් 400 ධාවන පථයක් සකස් කළ හැකි, බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති එකම ක්‍රීඩාංගනය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා 2005 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ;

(i) මධ්‍යම රජය විසින් වෙන්කරන ලද මුදල;

(ii) එයින් වැයකර ඇති මුදල;

(iii) බස්නාහිර පළාත් සභාව විසින් වෙන්කරන ලද මුදල;

(iv) එයින් වැයකර ඇති මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) වර්තමානයේ එම ක්‍රීඩාංගනය කිසිදු ක්‍රීඩාවක් තරඟකාරී ලෙස පැවැත්වීමට නොහැකි තත්වයකට පත්ව ඇති බැවින් එය සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාව දිය යුතුව ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0353/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්,

(i) ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) භූමි ප්‍රමාණය දළ වශයෙන් කොපමණද;

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iv) 2009 ඡන්ද නාම ලේඛනය අනුව ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට වඩා වැඩියෙන් ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාවක් සිටින ප්‍රාදේශීය සභා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය සභාවන්ට අයත් ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අධික ජනගහනය, භූමියේ පිහිටීම සහ පරිපාලනය පහසුව සළකා බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, බණ්ඩාරගම සහ මිල්ලනිය ලෙස ප්‍රාදේශීය සභා දෙකකට හෝ බණ්ඩාරගම නගර සභාව සහ මිල්ලනිය ප්‍රාදේශීය සභාව වශයෙන් පළාත් පාලන ආයතන දෙකකට හෝ වෙන්කිරීමට කටයුතු කරන්නෙහිද?

(ඈ) එසේ නම්, එලෙස නව පළාත් පාලන ආයතන සීමානිර්ණය කරන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 අගෝස්තු මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0228/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නෙහිද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0229/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නෙහිද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0230/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) එම පාසල්වල නම් කවරේද;
(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;
(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නෙහිද;
(ii) එම පාසල්වල නම් කවරේද;
(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;
(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;
(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;
(vi) එසේ නම් ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0332/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විදේශීය අනුබද්ධ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවායේ නම්, සභාපතිවරයාගේ නම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;
(iii) එම විශ්වවිද්‍යාල හරහා ලබා දී ඇති විදේශ ශිෂ්‍යත්ව ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට රජය ක්‍රියා කරන්නේද;
(ii) එසේ නම්, එහි ක්‍රියා පටිපාටිය කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0372/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 1990 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට උතුරු පළාතේ යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන දිස්ත්‍රික්කවල මුස්ලිම් විවාහ හා දික්කසාද පනත ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 අංක 11 දරන ක්වාසි අධිකරණ (පත්වීම් වලංගු කිරීම්) පනත යටතේ පත්කරනු ලැබ සිටි ක්වාසි විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;
(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම දිස්ත්‍රික්කවල, ඉහත දිනය වන විට පිහිටුවා තිබූ ක්වාසි අධිකරණ කලාප හෝ බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;
(ii) ඒවායේ නම් කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0373/'10

ගරු නූර්දීන් මෂූර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 1990 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට උතුරු පළාතේ යාපනය, කිළිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන පරිපාලන දිස්ත්‍රික්කවල මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහ වකුෆ් අංශයේ ලියාපදිංචි වී තිබූ,

(i) මුස්ලිම් පල්ලි, ජුම්ආ පල්ලි, තක්කියා, සාවියා සහ ධර්ගා යන මුස්ලිම් ආගමික පුණ්‍යායතනවල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) ඒවායේ නම්, ලිපිනයන් සහ ලියාපදිංචි අංක කවරේද:
(iii) මුස්ලිම් පල්ලි සහ පුණ්‍යායතනවල නීත්‍යානුකූල භාරකරුවන් වශයෙන්, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයෙන් හෝ මුස්ලිම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් එවකට පත්කරනු ලැබ සිටි තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;
(iv) එම එක් එක් මුස්ලිම් පල්ලි සහ පුණ්‍යායතනවලට අයත් යැයි කියනු ලබන (1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර භාරයන් හෝ වකුෆ් පනත යටතේ ලියාපදිංචි කොට ඇති) නිශ්චල දේපල හා ඉඩකඩම් කවරේද;
(v) ඉහත එක් එක් වකුෆ් දේපල පිහිටි ස්ථානයේ වරිපනම් අංක සහ ලිපිනයන් කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0295/'10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂයේදී පමණක් රජය ලබාගත් සම්පූර්ණ විදේශ ණය වටිනාකම කොපමණද;
(ii) එකී ණය ලබාගත් මූලාශ්‍ර හා පොලී අනුපාත කවරේද;
(iii) ලබාගත් ණය සඳහා ගිවිසුම්ගත කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂයේදී පමණක් රජය විසින් ආපසු ගෙවන ලද විදේශ ණය වටිනාකම කොපමණද;
(ii) එසේ පොලියත් සමග ආපසු ගෙවූ ණය, ලබාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0351/'10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය තුළ ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේන්තු සංඛ්‍යාව කොපමණද;
(ii) එම එක් එක් පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය හා අදාළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) එම මුදල්වල එකතුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0340/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) එල්. ටී. ටී. ඊ සංවිධානයේ කේ. පී. පත්මනාදන් දැනට සිටින ස්ථානය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඔහුට විරුද්ධව ඇති චෝදනා කවරේද;
(ii) එම චෝදනා ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීමට හේතු කවරේද;
(iii) ඔහු විසින් මේ රටේ ඒකීය භාවය විනාශ කිරීමට සහාය දැක්වූ බව රජය පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0342/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජී. එස්. පී. ප්ලස් සහනය යටතේ අප රටින් අපනයනය කරන නිෂ්පාදන වර්ගයන් කවරේද;
(ii) එම නිෂ්පාදන අපනයනය කරන රටවල් කවරේද;

(iii) නිෂ්පාදන යැවීමේදී ලබා දුන් බදු සහනය කොපමණද;
(iv) මෙම සහනය ඉවත් කළහොත් අහිමි වන රැකියා සංඛ්‍යාව කොපමණද;
(v) මෙම සහනය ඉවත් කිරීමෙන් බලපෑමක් ඇතිවන ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජය විදේශ විනිමය උපයා ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;
(ii) ජී. එස්. පී. ප්ලස් නොදුන් යුරෝපා රටවලට නිෂ්පාදන යැවීමේ දී සිදු වන පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0343/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 වර්ෂයේ සිට 2009 දක්වා විදේශ විශ්වවිද්‍යාල වලට ගිය ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංඛ්‍යාව, රටවල් අනුව කවරේද;
(ii) එම සිසුන් අධ්‍යාපනය ලැබීමට ඇතුළත් වූ අංශ කවරේද;
(iii) ඉහත සිසුන්ට වැයවන විදේශීය විනිමය ප්‍රමාණය කොපමණද;
(iv) එවැනි විශාල මුදලක් වැයවීම වැළැක්වීමට දේශීය වශයෙන් විකල්ප වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0101/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 සිට 2010 වර්ෂය දක්වා වූ කාල සීමාවේදී, එක් එක් වර්ෂයේදී සමස්ත ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන්,
(i) ක්‍රියාත්මක වූ පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) වසා දමන ලද පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව සහ ඒවා කවරේද;
(iii) ආරම්භ කරන ලද පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව සහ ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 සිට 2010 දක්වා කාලසීමාවේදී ශ්‍රී ලංකාව තුළ පාසල් වසා දැමීමට හේතුවූ කරුණු මොනවාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010.06.01 දිනට කැබිනට් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;
(ii) අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0310/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වනවිට අළුතින් ඉදිකරමින් පවතින සංචාරක හෝටල් සංඛ්‍යාව කොපමණද;
(ii) ශ්‍රී ලංකාවේ සංචාරය නොකරන ලෙස තවමත් තම පුරවැසියන්ට උපදෙස් දෙන රටවල්වල නම් කවරේද;
(iii) එවැනි බාධක ජය ගැනීම සඳහා ගනිමින් තිබෙන පියවර කවරේද;
(iv) පසුගිය අවුරුදු 10 තුළ මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව ඔවුන් පැමිණි රටවල් අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0313/'10

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 10 තුළ විශ්‍රාම වැටුප් හිමි රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළ දිනයන් සහ ඒ එක් එක් අවස්ථාවේ වැඩි කරන ලද වැටුප් ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 10 කට පෙර ලැබූ මාසික වැටුප සමඟ සැසඳීමේ දී අද දිනට "තථ්‍ය ක්‍රය ශක්තිය" එක් එක් වර්ෂයේ උද්ධමන අනුපාතයන් සමඟ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජීවන වියදම් දීමනාවේ වටිනාකම කොපමණද;

(ii) එය මාසිකව ගෙවනු ලබන්නේද;

(iii) අවසන්වරට එය ගෙවනු ලැබූ දිනය හෝ මාසය කවරේද;

(iv) ජීවන වියදම් දීමනාව ගෙවා නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 අගෝස්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0231/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0232/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නෙහිද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල් වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම් ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0233/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නෙහිද;

(ii) එසේ නම් ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0352/'10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 2005 සිට මේ දක්වා ජනාධිපති සමාව යටතේ නිදහස් වූ සිරකරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එසේ නිදහස්වූවන්ගේ නම් හා එම එක් එක් පුද්ගලයා සිදු කළ වරද ඇතුළත් ලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0391/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැඟුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0392/'10

ගරු කනක හේරත් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භකර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0393/'10

ගරු දිළුම් අමුණුගම මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භකර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0394/'10

ගරු ජානක බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භකර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0395/'10

ගරු වී. කේ. ඉන්දික මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භකර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0396/'10

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භකර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0266/'10

ගරු රවුෆ් හකීම් මහතා,— ජාතික උරුමයන් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) පුරාවස්තු ආඥාපනත (188 වැනි අධිකාරය) යටතේ, ආරක්‍ෂා කළ යුතු ජාතික වැදගත් සිද්ධස්ථානයන් (ස්මාරක) ලෙස මේ දක්වා අදාළ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති, මුස්ලිම් ආගමික සිද්ධස්ථාන සහ මුස්ලිම් සංස්කෘතික කේන්ද්‍රස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එවැනි ස්ථාන වල නම්, ලිපිනයන්, ඒවා ගැසට් කළ දිනය හා එම ගැසට් අංකය දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0264/'10

ගරු රවුෆ් හකීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) උපාධිධාරී ගුරුවරයෙකු වූ කඩුගන්නාව, කුරුකන්තල, අංක 18 බී දරන නිවසේ පදිංචි එස්. එම්. එම්. හලීම් මහතා 2010.02.01 දින සිය සේවා ස්ථානය වන මාවනැල්ල සහිරා ජාතික පාසලේ රාජකාරියෙහි නිරතව සිටියදී බාහිර පුද්ගලයෙකු පාසල් පරිශ්‍රයට බලහත්කාරයෙන් ඇතුළු වී, හලීම් මහතාට පහර දී, ඔහුගේ පෞද්ගලික වාහනයකට අලාභහානි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) හලීම් මහතා විසින් ඒ පිළිබඳව මාවනැල්ල පොලීසියේ අංක 273/06 හා 2010.02.07 දිනැතිව පැමිණිල්ලක් කර තිබියදීත් ඒ සම්බන්ධයෙන් මේ දක්වාත් විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඇ) රජයේ පාසල් පරිශ්‍රයක් තුළ රාජකාරියට බාධා කරමින් ගුරුවරයෙකුට පහරදීමේ ක්‍රියාවක් සම්බන්ධයෙන් කරන ලද ඉහත පැමිණිල්ල පිළිබඳව, අපක්‍ෂපාති පරීක්‍ෂණයක් පැවැත්වීම සඳහා නියෝගයක් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0375/'10

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, උඳුන් තෙල් සහ ගුවන් යානා ඉන්ධන ලීටරයක විකුණුම් මිල කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් නිෂ්පාදනය සඳහා එක් ලීටරයක් මත පනවා ඇති සියලුම බදු වර්ග කවරේද;

(iii) ඉහත සඳහන් ඉන්ධන වර්ගයන්හි එක් ලීටරයක් සඳහා වන වියදම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර 5 තුළ,

(i) එක් මාසයක් තුළ අලෙවි කරන ලද ලීටර් ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(ii) ඉහත (අ)(i) කොටසේ සඳහන් වන ඉන්ධන වර්ග සඳහා වූ ලෝක වෙළඳපලෙහි මිල සමඟ සැසඳීමේ දී එක් ලීටරයක් සඳහා ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0376/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියළු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩ වල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩ වල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0380/'10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, අභියාචනාධිකරණයෙහි, මහාධිකරණයෙහි සහ මහේස්ත්‍රාත් අධිකරණවල සේවය කරන සියලු විනිශ්චයකාරවරුන්ගේ නම් සහ උපන් දිනයන් කවරේද;

(ii) ඔවුන්ගේ සුදුසුකම් සහ දැනට දරන තනතුරෙහි පළපුරුද්ද කවරේද;

(iii) නිල නිවාස සපයා ඇති සියලු කාණ්ඩවල විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) සියලු විනිශ්චයකාරවරුන්ට නිල නිවාස නොසැපයීමට හේතු කවරේද;

(v) නිල නිවාස නොලැබෙන්නේ නම්, ඔවුන්ට නිවාස දීමනාවක් ගෙවනු ලබන්නේද;

(vi) එසේ නම්, ගෙවනු ලබන මුදල සහ එය කොපමණ කාලයක් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 අගෝස්තු මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0234/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0235/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0236/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0397/'10

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ 2009 වර්ෂයේදී වාර්තාගත වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එය ඉන් පෙර වර්ෂය හා සැසඳීමේදී රෝගීන් සංඛ්‍යාවේ වැඩිවීමක් ද; නැතහොත් අඩුවීමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජරට ප්‍රදේශයේ ව්‍යාප්ත වකුගඩු රෝගය සඳහා හේතු වූ සාධක හඳුනාගෙන තිබේද;
(ii) එසේ නම්, ඒවා කවරේද;
(iii) අදාළ හේතු සාධක ප්‍රදේශයෙන් ඉවත් කිරීම සඳහා යෝජිත හෝ ක්‍රියාත්මක වැඩපිළිවෙලක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0398/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැනට ඇති ආරක්ෂිත ගේට්ටු නොමැති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;
(ii) උණ බම්බු ගේට්ටු සහිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග හේතුවෙන් 2009 වර්ෂය තුළ දී වාර්තාගත හදිසි අනතුරු සංඛ්‍යාව කොපමණද;
(ii) එනිසා සිදුවූ ජීවිත හානි සංඛ්‍යාව කොපමණද;
(iii) ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ඉදිකිරීම සඳහා යෝජිත කඩිනම් වැඩපිළිවෙලක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0399/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි විසිතුරු මත්ස්‍ය අපනයන ආයතන සංඛ්‍යාව කවරේද;
(ii) 2009 වර්ෂයේදී විසිතුරු මත්ස්‍ය අපනයනය මගින් ඉපැයූ මුළු ආදායම කොපමණද;
(iii) එය පෙර වර්ෂය හා සැසැඳීමේදී ආදායම වර්ධනය වීමක්ද; අඩුවීමක්ද;
(iv) 2009 වර්ෂයේදී විසිතුරු මත්ස්‍යයන් සඳහා පැවති ලෝක වෙළඳපොළ ඉල්ලුමෙන් ශ්‍රී ලංකාව අපනයනය කළ ප්‍රතිශතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේදී අධි පරිභෝජනය නිසා මේ වන විට වඳවීමේ තර්ජනයට ලක් වූ මත්ස්‍ය විශේෂ හඳුනාගෙන තිබේද;
(ii) විසිතුරු මත්ස්‍ය අපනයන ප්‍රවර්ධනය සඳහා යෝජිත සැලසුම් තිබේද;
(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0401'10

ගරු දිළුම් අමුණුගම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඊ ගම්මාන ව්‍යාපෘතියේ අරමුණු කවරේද;
(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂය කවරේද;
(iii) එහි නියමු ව්‍යාපෘතිය දියත් කරන ලද පළාත් කවරේද;
(iv) එයට අයත් වූ පාසල්වල නම් කවරේද;
(v) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලැබුණු ආධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතිය තව දුරටත් පුළුල් ලෙස දියත් කිරීම සඳහා අනාගත සැලසුම් තිබේද;
(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0402/'10

ගරු තාරානාත් බස්නායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට හඳුනාගෙන ඇති ආක්‍රමණික ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන් ජලජ ආක්‍රමණික ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ජලජ ආක්‍රමණික ශාක විශේෂයන්හි සීඝ්‍ර වර්ධනය හා ව්‍යාප්තිය, ජලය බැස යන මාර්ග අවහිරවීම් සහ ක්ෂණික ගංවතුර ඇතිවීම් සඳහා හේතුවන බව එතුමා පිළිගන්නෙහි

(ඇ) (i) මෙම ජලාශ්‍රිත ආක්‍රමණික ශාක මර්ධනය හෝ ඒවා ප්‍රයෝජනවත් ලෙස භාවිතය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0403/'10

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනවසර මැණික් ගැරීම් මැඩ පැවත්වීම සඳහා 2009 වර්ෂය තුළ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් මෙහෙය වූ වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එයින් ලැබූ හෝ ලැබීමට අපේක්ෂා කළ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂය තුළ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය මගින් ඉපැයූ මුළු ආදායම මිලියන කොපමණද;

(ii) එය පෙර වර්ෂය හා සැසඳීමේදී සමස්ථ ආදායම වැඩිවීමක් හෝ අඩුවීමක්ද;

(iii) කිම්බර්ලි ක්‍රියාවලි සහතික ක්‍රමය යනු කුමක්ද;

(iv) 2009 වර්ෂය තුළදී මැණික් හා ස්වර්ණාභරණ අපනයනය ප්‍රවර්ධනය සඳහා ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0404/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරට ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින් නිෂ්පාදනය වන උපද්‍රවකාරී අපද්‍රව්‍ය පිළිබඳව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තයන් තක්සේරු කිරීමේ යාන්ත්‍රනයක් තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) එම උපද්‍රවකාරී අපද්‍රව්‍ය පරිසර හිතකාමී අයුරින් බැහැර කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනයේදී ප්‍රවාහනයට අදාල ප්‍රකාශ පත්‍රයක් අදාළ පාර්ශවයන් විසින් සම්පූර්ණ කළ යුතුද;

(ii) එසේ නම්, එහි අරමුණ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0405/'10

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වූ මුළු ඒඩ්ස් රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එයින්, මෙතෙක් මියගිය රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රුධිර පාරවිලයනය මගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මත්ද්‍රව්‍ය එන්නත් කිරීම මගින් ඒඩ්ස් රෝගයට ගොදුරු වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝගී මවගෙන් රෝගය වැළඳුනු දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2007, 2008 හා 2009 වර්ෂවල ඒඩ්ස් රෝගීන්ගේ ප්‍රතිකාර සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

(ii) ඒඩ්ස් රෝග ව්‍යාප්තිය මර්ධනය සඳහා දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0381/'10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 15 තුළ එක් එක් වර්ෂයේදී පළමුවැනි ශ්‍රේණියට ඇතුළු වූ සිසුන් සංඛ්‍යාව;

(ii) සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සඳහා වසරකට පෙනී සිටින සිසුන් සංඛ්‍යාව;

(iii) විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වසරකට සුදුසුකම් ලබන සිසුන් සංඛ්‍යාව;

(iv) දේශීය විශ්වවිද්‍යාල වලට ඇතුළුවීමට සුදුසුකම් නොලැබීම හේතුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වසරකට විදේශගත වන සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) විදේශිය විශ්වවිද්‍යාලවල අධ්‍යාපන ලැබීම වෙනුවෙන් ගෙවන ගාස්තු වශයෙන් රටෙන් බැහැර යැවෙන මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0382/'10

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඩෙංගු උණ හේතුවෙන් පසුගිය වර්ෂ 2 තුළ කොළඹ දිස්ත්‍රික්කයේ මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) වාර්ෂික පදනමින් සහ දිස්ත්‍රික් පදනමින් පසුගිය වර්ෂ 5 තුල වාර්තා වී ඇති ඩෙංගු මරණ සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ඩෙංගු ව්‍යසනය මර්ධනය කිරීම සඳහා රජය දරන පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 2 තුළ මෙරට පැතිර ගිය අනෙකුත් වසංගතවල නම් කවරේද;

(ii) එකී එක් එක් රෝගයෙන් මියගිය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0383/'10

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ සර්පයන් විසින් දෂ්ට කරනු ලැබීම නිසා සිදුවූ මරණ සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) සර්පයන් දෂ්ට කළ අවස්ථාවලදී ප්‍රතිකාර ලෙස ලබාදෙන ප්‍රති විෂ එන්නත් ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් තරමින් තිබේද;

(iii) නොඑසේ නම්, එම එන්නත් නොතිබීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සර්පයන් විසින් දෂ්ට කරනු ලැබීමෙන් රෝගී තත්ත්වයට පත්වන පුද්ගලයින් සංඛ්‍යාව අඩු කරන්නේ කෙසේද;

(ii) සර්පයන් විසින් දෂ්ට කරනු ලබන අවස්ථා අඩුකර ගැනීමට අදාළ දැනුවත්කිරීමේ වැඩසටහන් මෙරට තුළ පවත්වනු ලබන්නේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් පවත්වනු ලබන ස්ථාන, අදාළ බලධාරීන් සහ එවැනි වැඩ සටහන් පැවැත්වීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0137/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2002 වර්ෂය වන විට යාපනයේ හමුදා මූලස්ථානවලින් ලබාගත් විදේශීය දුරකථන ඇමතුම් වෙනුවෙන් රු. 2,018,331.00 ක හිඟ මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ගෙවීමට තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම බිල්පත් නොපියවීම සම්බන්ධව ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම නීත්‍යානුකූලව කටයුතු කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මේ වන විට එම හිඟ මුදල පියවීමට කටයුතු කර තිබේ ද;

(ii) එසේ නම්, ඒ කුමන අරමුදලකින්ද;

(iii) ඒ සඳහා අනුමතිය ලබාදුන් අයගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?